දිස්ත්‍රික් ලේකම් කාර්යාලය - හම්බන්තොට
மாவட்ட செயலகம் - ஹம்பாந்தோட்டை
District Secretariat - Hambantota

පළමු මහල, මාගම් රුහුණුපුර පරිපාලන සංකීර්ණය, සිරිබෝපුර, හම්බන්තොට, 1ஆம் மாடி, றுஹுணு மாகம்புர நிர்வாக கட்டிடத் தொகுதி, சிறிபோபுர ஹம்பாந்தோட்டை 1st Floor, Magam Ruhunupura Administrative Complex, Siribopura, Hambantota

"සෞභාග්‍යමත් අනාගතයක් උදෙසා"
"செளபாக்கியமான எதிர்காலத்திற்காக"
"For a prosperous future"

| | | | |
|---|---|---|---|
| මගේ අංකය / எனது இலக்கம் / My No | DSH/DPS/5/DCC/Report/2026 | ඔබේ අංකය / உமது இலக்கம் / Your No | |
| දිනය / திகதி / Date | 2026.08. 11 | | |

හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ
සියලුම සාමාජික මහත්ම මහත්මීන් වෙත,

<u>හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව - 2026.07.31</u>

2026.07.31 වන දින පවත්වන ලද හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම් වාර්තාව අවශ්‍ය කටයුතු සඳහා මේ සමඟ ඔබ වෙත එවමි.

02. එම වාර්තාවේ ඔබ ආයතනයට අදාළ කාර්යයන් ඉතා කඩිනමින් සාර්ථකව ඉටු කිරීමටත්, ඒ සඳහා අවශ්‍ය වෙනත් ආයතන වල සහයෝගය ලබා ගන්නා ලෙසත් දන්වා සිටින අතර, එම කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ඇතිවන ගැටළු නිරාකරණය කිරීම සඳහා අපගේ සහයෝගය අවශ්‍ය අවස්ථා වලදී නොපමාව ඒ පිළිබඳ දන්වා අවශ්‍ය කටයුතු සම්පාදනය කරගන්නා ලෙසත් කාරුණිකව ඉල්ලමි.

03. එසේම, මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීමට ඉදිරිපත් කිරීම සඳහා ඉහත වාර්තාවේ ඔබ වෙත පැවරී ඇති වගකීම් ඉටු කිරීම පිළිබඳ ප්‍රගතිය මා වෙත DCC Hambantota WhatsApp. සමූහය වෙත හෝ dpshambantota@gmail.com වෙබ් ලිපිනයට ලබා දීමට කටයුතු කරන ලෙස ද ඉල්ලමි.

04. තවද, මෙම වාර්තාව www.hambantota.dist.gov.lk දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය වෙබ් අඩවිය වෙත පිවිසීමෙන් ද ලබාගත හැකි බව කාරුණිකව දැනුම් දෙමි.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය.
දුරකථන /ෆැක්ස් :- 0472256234
විද්‍යුත් ලිපිනය :- dpshambantota@gmail.com

පිටපත් -

1. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමා - කරු.දැ.ගැ.ස.
2. හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති හා දකුණු පළාත් ගරු ආණ්ඩුකාරවර මහාචාර්ය සුසිරිපාල මානවඩු මැතිතුමා - කරු.දැ.ගැ.ස
3. ජනාධිපති ලේකම් - දැ.ගැ.ස
4. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යංශය - දැ.ගැ.ස.

## හම්බන්තොට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම
## 2026.07.31

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ගරු සම සභාපති, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී නිහාල් ගලප්පත්ති මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් ගරු නියෝජ්‍ය අමාත්‍යවරුන්, හම්බන්තොට දිස්ත්‍රික් ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඇතුළු සියලුම දේශපාලන නායකත්වයෙන් මෙන්ම රාජ්‍ය නිලධාරීන්ගේ සහභාගීත්වයෙන් 2026.07.31 වන දින පෙ.ව. 9.00ට දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයීය ප්‍රධාන රැස්වීම් ශාලාවේ දී පවත්වන ලදී.

රැස්වීමට සහභාගී වූ සියලුම දේශපාලන නායකයින් මෙන්ම අනෙකුත් සියලුම රාජ්‍ය නිලධාරීන් ඇතුළු සියලු දෙනාම දිස්ත්‍රික් ලේකම් විසින් පිළිගැනීමෙන් අනතුරුව, ඉඩම් හා වාරිමාර්ග ගරු නියෝජ්‍ය අමාත්‍ය අරවින්ද සෙනරත් විතාරණ මැතිතුමා විසින් පසුගිය වාර්තාවේ ප්‍රගතිය සාකච්ඡා කිරීමෙන් පසු රැස්වීම් වාර්තාව සභා සම්මත කර න්‍යාය පත්‍රයට අනුව සභාවේ කටයුතු සිදු කරන ලදි. එහිදී සාකච්ඡා කරන ලද කරුණු හා ගනු ලැබූ තීරණ පහත පරිදි වේ.

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 01. | 2026.05.29 දිනැති සම්බන්ධීකරණ රැස්වීමේ ප්‍රගතිය සාකච්ඡා කිරීම. | | | |
| 1.1 | ධීවර වරායන් ආශ්‍රිතව ඩෙංගු වසංගතය ව්‍යාප්තිය | ඩෙංගු මර්ධන විශේෂ වැඩසටහන යටතේ සියළුම වරායන් සඳහා වැඩපිළිවෙලක් සකස් කර ඇති අතර එහිදී සෞඛ්‍ය වෛද්‍ය කාර්යාලය විසින් රසායනික පොට්ටනියක්, නවතා තිබෙන බෝට්ටු තුළට බහා තැබීමට කටයුතු කරන බවත් ඒ තුළින් මාස 06ක පමණ කාලයක් එකී පොට්ටනිවල සක්‍රිය බව පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. නමුත් ධීවර ප්‍රජාව තුළ පවතින මිථ්‍යා මතයක් නිසා මෙම රසායනික පොට්ටනිය ඉවත් කිරීමට කටයුතු කරන බැවින් මේ සඳහා සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ බෙදන ලද පාර්සලයක් බවට ලේබලයක් සහිතව ලබාදීම සුදුසු බවට යෝජනා විය. | සෞඛ්‍ය අමාත්‍යාංශය යටතේ ලබාදෙන රසායනික පාර්සලයක් ලෙස ලේබලයක් සහිතව මෙය ලබාදීම සුදුසු බවට උපදෙස් ලබාදුන් අතර මෙහි ප්‍රගතිය පිළිබඳ සම්පූර්ණ වාර්තාවක් ලබාදෙන ලෙස ද උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>සහකාර අධ්‍යක්ෂ ධීවර<br><br>කළමනාකරු ධීවර වරාය |
| 1.2 | ආයුර්වේද රෝහල් තුළ භාවිතා නොකළ යකඩ ඇඳන් 50 ක් පැවතීම. | නිවර්තන නිවාසයට මෙම ඇඳන් ලබා දීම සඳහා සමාජ සේවා දෙපාර්තමේන්තුවට මේ වන විටත් ලිපි යවා ඇති බවට කරුණු ඉදිරිපත් විය. එමෙන්ම දිස්ත්‍රික්කයේ ජාතික පාසල් හා මහ විද්‍යාල තුළ Sike Room වල ඇඳන් නොමැති පාසල් සඳහා මෙම ඇඳන් ලබාදීම සුදුසු බවට යෝජනා විය. | නිවර්තන නිවාසයට දිනයක් ලබා දී කඩිනමින් මෙම ඇඳන් රැගෙන යාමට කටයුතු කර අවසන් කරන ලෙස උපදෙස් ලබාදුන් අතර දිස්ත්‍රික්කයේ අධ්‍යාපන කලාප 03 හි ජාතික පාසල් හා මහා විද්‍යාල වල ඇඳන් නොමැති පාසල්වල තොරතුරු අගෝස්තු 15 දිනට පෙර ලබා දී අවශ්‍ය ඇඳන් ලබා ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | පළාත් ආයුර්වේද කොමසාරිස්<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 1.3 | ව්‍යාපෘති භූමිය ප්‍රකාශිත අලි කළමනාකරණ රක්ෂිත භූමියෙන් පිටතට වැටෙන පරිදි සීමා මායිම් සලකුණු කර දෙන ලෙස ඉල්ලීම | සදර්න් ගෘප් සමාගම විසින් කලුගල් ආශ්‍රිත කර්මාන්තය වසර 30 ක පමණ කාලයක් සිදු කරන අතර මෙය පිහිටා තිබෙන්නතේ ප්‍රකාශිත අලි කලමණාකරණ කලාපයේ මායිමේ සිට මීටර් 140 ක් පමණ දුරින් බවත් මෙම ව්‍යාපෘති භූමිය ප්‍රකාශිත අලි කලමණාකරණ රක්ෂිතයෙන් පිටතට වැටෙන පරිදි සීමා මායිම් සලකුණු කිරීමට අවශ්‍ය කටයුතු සිදුකර දෙන ලෙස ඉල්ලා සිටින ලදී. | අලි කළමනාකරණ රක්ෂිතය ප්‍රකාශයට පත්කර ඇති බැවින් ඉන් පිටතට වැටෙන පරිදි සලකුණු කිරීම ගැටළු සහගත වන හෙයින් එම කටයුතු සිදු නොකරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරි<br><br>සහකාර අධ්‍යක්ෂ වන ජීවි |
| 1.4 | තංගල්ල නගරසභා ගිනි නිවන ඒකකය මඟින් ලබාදෙන ලද සේවා සඳහා සේවා ගාස්තු නොගෙවීම හා ඒ සඳහා යෝජනා ඉදිරිපත් කිරීම | 2017 වසරේ සිට මුදල් නොගෙවූ ආයතන සහ පුද්ගලයින් සඳහා ඔවුන් ගෙවිය යුතු හිඟ මුදල සහ එම මුදල් ලබා දිය යුතු දිනයන් ඇතුළත් කර ලිපි යවන ලද බවට කරුණු ඉදිරිපත් විය | සිහිකැඳවීම කඩිනම් කරන ලෙස උපදෙස් දෙන ලදී. | සභාපති තංගල්ල නගර සභාව<br><br>පළාත් පාලන සහකාර කොමසාරිස් |
| 1.5 | ආලෝකපුර ඉඩම් ගැටළුව | ආලෝකපුර වාගව් මාවතේ වරාය සඳහා ඉඩම් පවරාගත් කොටස කිසිම සංවර්ධන කටයුත්තක් සඳහා යොදා නොගෙන ඇති අතර මේ වනවිට ඝණ කැලෑවක් බවට පත්ව විවිධ සමාජ විරෝධී ක්‍රියාවන් සිදුවන බවත් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව එම ප්‍රදේශයේ පදිංචි කරුවන්ට විකල්ප ඉඩම් හා වන්දි ලබා දී එම භූමිය වරාය අධිකාරිය වෙත පවරා ඇති බවට සහ ශ්‍රී ලංකා වරාය අධිකාරිය මේ පිළිබඳ දැනුවත් කර ඇති බවට ද කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ වරාය අධිකාරියට නැවත සිහි කැඳවීම් කරන ලෙස උපදෙස් ලබාදුන් අතර ඉදිරි සම්බන්ධීකරණ කමිටුවට වරාය අධිකාරියේ වගකිවයුතු නිලධාරියෙකු කැඳවීමට තීරණය විය. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |
| 1.6 | ගොන්නෝරුව සිවරජගම ගම්මානයේ නිවාස 07 ක පදිංචිකරුවන් හට නිවාස හා ප්‍රවේශ මාර්ග අහිමිවීමේ අවදානමක් පැවතිම | උදාගම්මාන සංකල්පය යටතේ 2017 වසරේ නිවාස සංවර්ධන අධිකාරිය මඟින් නිවාස 30 ක් ඉදිකර දී ඇති හම්බන්තොට ගොන්නෝරුව සිවරජගම ගම්මානයේ නිවාස 07ක පදිංචිකරුවන්ට ගරු අධිකරණයෙන් ලබා දී ඇති නඩු තීන්දුවක් හේතුවෙන් නිවාස සමඟ ඉඩම් අහිමි වීමේ අවදානමක් පවතින බවත් එමෙන්ම සියලුම නිවාසවල පදිංචිකරුවන්ට ප්‍රවේශ මාර්ගය ද අහිමිවීම සිදුවිය හැකි බැවින් අධිකරණයෙන් ඉඩම හිමි වූ තැනැත්තිය සමඟ සාකච්ඡා කොට ඇයගේ ඉඩම සඳහා වෙනත් විකල්ප ක්‍රමවේදයක් සැකසීම සුදුසු බවට කරුණු ඉදිරිපත් විය. මෙම නඩුව සඳහා මහවැලි අධිකාරිය | මේ සම්බන්ධව අදාළ පාර්ශව කැඳවා වෙනම ම සාකච්ඡාවක් සිදු කරන ලෙස උපදෙස් දෙන ලද අතර ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය සහ ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මීට අදාළ නඩුව සඳහා මෝසමක් ඉදිරිපත් කර පාර්ශවකරුවන් වීම සුදුසු බවට තීරණය විය. | අතිරේක දිස්ද් ලේකම් (ඉඩම්)<br><br>නේවාසික ව්‍යාපාර කළමනාකරු ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය<br><br>ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට<br><br>දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | හෝ ජාතික නිවාස සංවර්ධන අධිකාරියට දැනුම් දී නොමැති බවත් ඒ හේතුවෙන් නිවාස හිමිකරුවන් වෙනුවෙන් ගරු අධිකරණයේ පෙනී සිටීමට අවස්ථාවක් නොලැබුන බවත් ප්‍රකාශ විය. | | |
| 1.7 | 2026 දිවියට සවියක් නිවාස වැඩසටහන | කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය මඟින් ක්‍රියාත්මක කරනු ලබන මෙම වැඩසටහන යටතේ ළමා සංවර්ධන මධ්‍යස්ථාන වල ජීවත් වී සමාජගත වූ, තෝරා ගන්නා ප්‍රතිලාභීන්ට නිවාස අදියර මට්ටමින් ඉදිකිරීම සහ ප්‍රතිලාභීන්ට ඉඩම් ලබාදීම සිදු කරන අතර මේ සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ ළමා සංවර්ධන මධ්‍යස්ථානවල ජීවත් වී සමාජගත වූ හා අවධානමට ලක් වී ඇති දරුවන්ගේ නාම ලේඛනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී. | මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයකින්ම අවම වශයෙන් පර්.10 බැගින් ඉඩම් කැබලි 03ක් ලෙස හඳුනාගෙන ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br>දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන්<br>දිස්ත්‍රික් කළමනාකරු ජාතික නිවාස සංවර්ධන අධිකාරිය |
| 1.8 | AJR තිලක් රෝහණ කළුගල් ව්‍යාපෘතිය විශාල කිරීම සඳහා අනුමැතිය ලබා ගැනීම. | දැනට පවතින කළුගල් වල මගින් නිෂ්පාදනය වන ගල් ප්‍රමාණය දැනට පවතින ව්‍යාපෘති වලට සැපයුම් කිරීමට ප්‍රමාණවත් නොවන හෙයින් මෙම ගලට යාබදව ඇති හෙක්ටයාර් 07ක පමණ පැතිර ගිය කළුගල සහිත ඉඩම ලබාදෙන ලෙසත් තවද එහි සෝලා ව්‍යාපෘතියක් දැනට ක්‍රියාත්මක කිරීමට යෝජනා කර ඇති බැවින් එය ගල් නිධියෙන් බැහැරව ඉදිකරන ලෙස ත් ඉල්ලා සිටින ලදී. | මේ පිළිබඳ අමාත්‍යාංශ මට්ටමින් සාකච්ඡා කර විසඳුම් ලබාගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 02. | 2026 වසරේ සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය ඉදිරිපත් කිරීම. | | | |

| ප්‍රා.ලේ.කො | ප්‍රජාශක්ති වැඩසටහන | | ග්‍රාමීය මාර්ග වැඩසටහන | | විමධ්‍යගත අයවැය වැඩසටහන | | නිල සෙවණ සේවා පියස | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා, රු.මි. | ව්‍යාපෘ. ගණන | ප්‍රතිපා. රු.මි. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| කටුවන | 58 | 83.434 | 08 | 20.80 | 19 | 5.10 | - | - | |
| වලස්මුල්ල | 51 | 72.498 | 07 | 20.80 | 12 | 4.20 | - | - | |
| වීරකැටිය | 65 | 76.248 | 07 | 20.80 | 17 | 5.30 | - | - | |
| ඕකෙවෙල | 29 | 40.552 | 07 | 20.80 | 03 | 5.00 | - | - | |
| බෙලිඅත්ත | 74 | 89.747 | 06 | 20.80 | 09 | 7.20 | 05 | 11.75 | අධ්‍යක්ෂ ක්‍රමසම්පාදන |
| තංගල්ල | 76 | 94.123 | 01 | 21.00 | 29 | 10.85 | 10 | 14.84 | |
| අඟුණුකොලපැ. | 51 | 73.172 | 01 | 20.80 | 11 | 5.25 | - | - | |
| අම්බලන්තොට | 56 | 86.288 | 06 | 20.80 | 13 | 6.45 | - | - | |
| හම්බන්තොට | 30 | 59.900 | 06 | 20.80 | 04 | 6.30 | - | - | |
| සූරියවැව | 23 | 51.479 | 07 | 20.80 | 07 | 5.20 | - | - | |
| තිස්සමහාරාම | 52 | 89.641 | 05 | 21.00 | 14 | 5.70 | - | - | |
| ලුණුගම්වෙහෙර | 36 | 64.008 | 05 | 20.80 | 11 | 4.50 | - | - | |



බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | | සාකච්ඡා වූ කරුණ | | | | තීරණය | | | වගකීම |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| එකතුව | | 601 | 881.04 | 66 | 250.00 | 149 | 71.05 | 15 | 26.59 | |

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 2.1 | සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | ඉහත සංවර්ධන වැඩසටහන් යටතේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මගින් අනුමත කර එවා තිබූ සංශෝධන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු ආවරණ අනුමැතියට යටත්ව ඉදිරිපත් කළ බවත් ඒ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලෙස දැනුම් දෙමින් එම වාර්තාව සභාවට ඉදිරිපත් කරන ලදී. | චක්‍රලේඛ ප්‍රකාරව ප්‍රමිතියකින් යුක්තව නියමිත දිනට වැඩ අවසන් කිරීමට උපදෙස් ලබා දෙමින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබා දෙන ලදී. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |
| | | එමෙන්ම මෙහිදී ග්‍රාමීය මාර්ගවල අනාරක්ෂිත ස්ථාන සකස් කිරීම සඳහා වෙන්කිරීමට නියමිත ප්‍රතිපාදන යටතේ ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටු මගින් එක් ප්‍රාදේශිය ලේකම් කොට්ඨාසයකට රු.මි. 05 බැගින් යෝජනා ඉදිරිපත් කර ඇති බව දැනුම් දෙන ලදී. නමුත් රු.මි. 05 ක ප්‍රමාණයකින් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයක අනතුරුදායක ස්ථාන සීමිත ප්‍රමාණයක් සකස් කිරීම වෙනුවට තෝරාගත් කොට්ඨාශ කිහිපයකට වැඩි ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කර එමගින් එම ප්‍රදේශ සංවර්ධනය කර ගැනීම වඩාත් සුදුසු බවත් ඉදිරි වසර වල ද මෙම වැඩසටහන යටතේ ප්‍රතිපාදන වෙන් කිරීමට හැකි බවත් එබැවින්, ලැබී ඇති ප්‍රතිපාදන වලින් උපරිම ප්‍රයෝජනයක් ලැබෙන පරිදි කොට්ඨාශ 03 ක් තෝරාගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සුදුසු බවට සාකච්ඡා විය. | භූ විෂමතාවය සහ මාර්ගවල පිහිටීම සම්බන්ධව දීර්ඝ ලෙස සාකච්ඡා කිරීමෙන් අනතුරුව වඩාත් අනතුරුදායක ස්ථාන පවතින කටුවන, බෙලිඅත්ත හා ලුණුගම්වෙහෙර කොට්ඨාස තෝරාගන්නා ලෙස උපදෙස් දෙන ලද අතර එක් කොට්ඨාසයකට රු.මි. 20 ක් බැගින් වෙන් කර දීමට දිස්ත්‍රික් සම්බනධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව කටුවන/ බෙලිඅත්ත/ලුණුගම්වෙහෙර<br><br>ප්‍රාදේශීය ලේකම් කටුවන/ බෙලිඅත්ත/ලුණුගම්වෙහෙර<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී තංගල්ල |
| 03 | දකුණු පළාත් සභා සංවර්ධන වැඩසටහන යටතේ 2026 වසරේ ක්‍රියාත්මක කරන ලද සංවර්ධන වැඩසටහන් වල ප්‍රගතිය | | | |

| අමාත්‍යංශය | අනුමත ප්‍රතිපාදන මුදල රු.මි. | අනුමත ව්‍යාපෘති සංඛ්‍යාව | ක්‍රියාත්මක වෙමින් පවතින ව්‍යාපෘති සංඛ්‍යාව | වැඩ අවසන් ව්‍යාපෘති සංඛ්‍යාව | වියදම රු.මි. |
|---|---|---|---|---|---|
| ප්‍රධාන අමාත්‍යංශය | 731.96 | 229 | 215 | 14 | 32.54 |
| කෘෂිකර්ම අමාත්‍යංශය | 444.94 | 162 | 135 | 22 | 52.51 |
| ධීවර අමාත්‍යංශය | 241.86 | 86 | 79 | 7 | 47.71 |
| ක්‍රීඩා අමාත්‍යංශය | 176.20 | 62 | 53 | 9 | 42.62 |
| අධ්‍යාපන අමාත්‍යංශය | 460.04 | 61 | 49 | 12 | 12.85 |
| **එකතුව** | **2054.99** | **600** | **531** | **64** | **188.22** |

වගකීම: ප්‍රධාන ලේකම් දකුණු පළාත; අමාත්‍යංශ ලේකම්වරුන් දකුණු පළාත් සභාව; නියෝජ්‍ය ප්‍රධාන ලේකම් සැලසුම් හා මෙහෙයුම් දකුණු පළාත

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 3.1 | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සෞඛ්‍ය සැලැස්මට අදාළ සංශෝධන 04 අනුමැතිය | 2026 පළාත් නිශ්චිත සංවර්ධන ප්‍රදාන සෞඛ්‍ය සැලැස්මට අදාළව හම්බන්තොට දිස්ත්‍රික්කයේ ක්‍රියාකාරකම් සංශෝධන 04 සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට 2026.07.14 දිනැති ලිපිය මගින් ඉල්ලා ඇත. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරුන් |



ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 04 | සෞඛ්‍ය අංශයෙන් ඉදිරිපත් කරන ලද කරුණු. | තංගල්ල මූලික රෝහල වෙත නළගමින් ජලය නොලැබීම නිසා ජල හිඟයක් මතුව ඇති බවට කරුණු ඉදිරිපත් විය.<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලයෙහි අවුරුදු 03 යි මාස 04 ක පමණ කාලයක සිට ස්ථිර ගණකාධිකාරී තනතුර පුරප්පාඩුව පවතින හෙයින් ප්‍රසම්පාදන කටයුතු අඩපණ වීම ආදී ගැටලු රැසකට මුහුණ දී ඇති බැවින් ස්ථිර ගණකාධිකාරිවරයෙක් ලබා දීමට කටයුතු සිදු කරන ලෙස ඉල්ලා සිටින ලදී.<br><br>හම්බන්තොට මහ රෝහල ආශ්‍රිතව පවතින ගස් කඩිනමින් කපා ඉවත් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බවට කරුණු ඉදිරිපත් වු අතර තවද, රෝහල් පරිශ්‍රයෙන් පිටත අපිරිසිදු වීම නිසා ඩෙංගු රෝගය ව්‍යාප්ත වීමේ අවධානමක් පවතින බැවින් නගර සභාවේ ද සහයෝගයෙන් පිරිසිදු කිරීම කටයුතු සිදු කරන බවට දැනුවත් කරන ලදී. විශේෂයෙන් මෙම පරිශ්‍රය ආශ්‍රිතව කුණු දැමීම තහනම් කරන ලෙසත් කසල බැහැර කරන අය වෙත දඩ ගැසීමේ ක්‍රියාවලියක් සිදු කරන ලෙසත් නගර සභාව මඟින් කසල රැස් කරන භාජන තැබීමට කටයුතු සිදු කිරීම ද සුදුසු බවට යෝජනා විය.<br><br>එසේම, ප්‍රජා සෞඛ්‍ය දිස්ත්‍රික් කාර්යාලයක් පවත්වා ගෙන යාම සඳහා සුදුසු ප්‍රදේශයක් ලබාදෙන ලෙස ඉල්ලා සිටින ලදී. | තංගල්ල මූලික රෝහල සහ බෙලිඅත්ත ආයුර්වේද රෝහල සඳහා ජලය සැපයීමේ සැලැස්ම අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලෙස සහ ජලහුලි සහ ජල බවුසර් 03ක් තංගල්ල රෝහල වෙත ලබාදීමට උපදෙස් දෙන ලදී.<br><br>සෞඛ්‍ය අමාත්‍යාංශ ලේකම් වෙත ගණකාධිකාරීවරයෙක් දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ කාර්යාලය වෙත ස්ථිර ලෙස පත් කිරීමට කඩිනමින් පියවර ගන්නා ලෙස උපදෙස් දෙන ලදී.<br><br>දිස්ත්‍රික්කයේ ප්‍රමුඛතම කටයුත්තක් ලෙස සලකා රෝහලේ ගස් කපා ඉවත් කිරීමේ ක්‍රියාවලිය කඩිනමින් සිදු කරන ලෙස උපදෙස් දෙන ලදි.<br><br>රෝහලේ පිටත පරිශ්‍රය පිරිසිදු කිරීමේ කටයුතු කඩිනමින් සිදුකර කසල එකතු කිරීම සඳහා ජලය නොරැඳෙන බඳුන් භාවිතා කරන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>හම්බන්තොට පරණ ප්‍රාදේශීය සභා ගොඩනැගිල්ල පිහිටා තිබෙන ස්ථානය පිළිබඳ අධ්‍යයනය කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති තංගල්ල ප්‍රාදේශීය සභාව<br><br>ප්‍රාදේශීය ලේකම් තංගල්ල<br><br>කළමනාකරු ජාතික ජලසම්පාදන මණ්ඩලය<br><br>ප්‍රධාන ලේකම් ප්‍රධාන ලේකම් කාර්යාලය දකුණු පළාත<br><br>දිස්ත්‍රික් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ<br><br>රෝහල් අධ්‍යක්ෂ හම්බන්තොට මහ රෝහල<br><br>සභාපති රාජ්‍ය දැව සංස්ථාව<br><br>ගරු නගරාධිපති හම්බන්තොට<br><br>සභාපති හම්බන්තොට ප්‍රාදේශීය සභාව<br><br>ආයුර්වේද වෛද්‍ය නිලධාරී |
| 05 | දිස්ත්‍රික්කය තුළ පවතින ආරක්ෂක තත්ත්වය පිළිබඳ දැනුවත් කිරීම. | දිස්ත්‍රික්කය තුළ ගැහැණු දරුවන් අපයෝජනයට ලක්වීමේ වර්ධනයක් පවතින බවත් විශේෂයෙන්ම තාත්තා, බාප්පා සහ පෙම්වතා යන අය විසින් මෙම තත්ත්වය සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. මේ සඳහා දැනට අනාරක්ෂිත දරුවන් හඳුනාගැනීමේ ක්‍රියාවලියක් ක්‍රියාත්මක කරන බවට ද තොරතුරු දැක්විය.<br><br>එමෙන්ම ජාතික ආරක්ෂාවට බලපාන අපරාධ වාර්තා වී නොමැති බවත් මත් ද්‍රව්‍ය වැටලීම් කටයුතු අඛණ්ඩව සිදු | ළමා හා කාන්තා කටයුතු සම්බන්ධීකරණ කමිටුවේ දී මේ පිළිබඳ සාකච්ඡා කරන ලෙස උපදෙස් දෙන ලදී.<br><br>විෂ මත් ද්‍රව්‍ය බහුල කලාප තුළ වැටලීම් සිදු කිරීම සඳහා විශේෂ කණ්ඩායම් යොදා ගැනීම සිදු කරන ලෙසත් එවැනි ස්ථාන පිළිබඳ දැනුවත් කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරී , තංගල්ල |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | කරගෙන යන බවටත් කරුණු ඉදිරිපත් වූ අතර ලුනුගම්වෙහෙර ජලාශය මුල් කරගනිමින් කසිප්පු නිෂ්පාදනයට යොමු වී ඇති බවට තොරතුරු ඉදිරිපත් විය. | | |
| 06 I. | අලි වැට ඉදිකිරීම සම්බන්ධව පවතින ගැටළු | අලි-මිනිස් ගැටුම් වැළැක්වීම සඳහා 2026 වර්ෂයේ අයවැය යෝජනා මඟින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ කිලෝ මීටර් 39 ක් තුළ විදුලි වැට 06 ක් සඳහා ප්‍රතිපාදන වෙන්කර ඇති බවත් ඒ සඳහා අනුමැතිය අවශ්‍ය බවට කරුණු ඉදිරිපත් විය. එසේම, අලි වැට ඉදිකිරීමට අදාළ ඇස්තමේන්තු සකස් කර අවසන් බවත් එහි වැඩකටයුතු සිදුකරමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සඳහා අනුමැතිය ලබා දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවි (දකුණ) |
| 6 II. | අලි කළමනාකරණ (MER) ප්‍රදේශයේ විදුලි වැට සම්පූර්ණ කිරීම | MER වටා ශක්තිමත් විදුලි වැටක් ඉදිකිරීම සඳහා පෞද්ගලික අංශයේ දායකත්වය ලබා දීමට කැමැත්ත පලකර ඇති බවත් ඒ සඳහා රු.මි. 300 ක් ලබාදීමට හැකියාවක් පවතින බවත් මේ සඳහා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය අවශ්‍ය බවත් දැනුම් දෙන ලදි. එහෙත්, වනජීවි දෙපාර්තමේන්තුවේ එල්ලෙන විදුලි වැට ඉදිකිරීම් කටයුතු නොකරන බවට දැනුම් දෙන ලදි. නමුත් ප්‍රායෝගික අත්දැකීම් අනුව කණු සිටුවා සකස් කරන විදුලි වැටට වන අලින් හානි සිදුකලත් එල්ලෙන විදුලි වැට සඳහා හානි සිදු නොකරන බවටත් කරුණු ඉදිරිපත් විය. මෙහිදී වනජීවි දෙපාර්තමේන්තුවේ විදුලි වැට ඉදිකිරීම සම්බන්ධයෙන් වෙනමම තාක්ෂණික කණ්ඩායමක් සිටින බැවින් ඔවුන්ගේද අදහස් මේ සඳහාද සැලකිල්ලට ගැනීම සුදුසු බවට සාකච්ඡා විය. | මේ සඳහා අනුමැතිය ලබා දෙන ලද අතර එල්ලෙන වැට සාර්ථක ක්‍රමයක් බැවින් මේ සඳහා අමාත්‍යාංශ එකඟතාව ප්‍රධාන කාර්යාලයෙන් ලබා ගන්නා ලෙස ද විදුලි වැට සම්බන්ධ වනජීවි සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ තාක්ෂණික කණ්ඩායම් මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත කැඳවන ලෙසත් අගෝස්තු 01 දා සිට මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව දක්වා එල්ලෙන වැට හේතුවෙන් සිදුවන ගැටළු පිළිබඳ දෛනිකව වාර්තාවක් ලබාගෙන එය ඉදිරිපත් කරන ලෙසත් උපදෙස් දෙන ලදි. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්)<br><br>සහකාර අධ්‍යක්ෂ වනජීවි (දකුණ) |
| 07 | **ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු මඟින් ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 7.1 | වෙළඳ ස්ථාන/ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීමේ ප්‍රඥප්තිය සංශෝධනය කිරීම සුදුසු බව යෝජනා කිරීම | හම්බන්තොට ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ කැලියපුර වසමේ ජීවත්වන පවුල් 60 කට වැඩි ප්‍රමාණයක් මැටි නිෂ්පාදන කර්මාන්තයේ මීට වසර 30-40 කට ආසන්න කාලයක පටන් රාජ්‍ය අනුග්‍රහය මත තියැලී ඇති අතර දැනට මෙම සියළු කර්මාන්තකරුවන් තනි පුද්ගල ව්‍යාපාර වශයෙන් පවත්වා ගෙන යන බැවින් ව්‍යාපාර ආරම්භ කර | මේ සඳහා පළාත් සභාව පිහිටවිය යුතු බවත් එබැවින් නව ව්‍යාපාරයන් ලෙස ලියාපදිංචි කරන ලෙස දැනුවත් කරන මෙන් උපදෙස් දෙන ලදි. | ප්‍රාදේශීය ලේකම් හම්බන්තොට |



හිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| | | දින 90කට වැඩි කිසිදු ව්‍යාපාරයක් දකුණු පළාත් සභාව තුල ලියාපදිංචි කිරීම සිදුකළ නොහැකිය යන උපදෙස් අනුව ව්‍යාපාර නාම ලියාපදිංචි කිරීම ගැටළුවක් වී තිබෙන බවත් මෙම මැටි කර්මාන්තකරුවන් අඛණ්ඩව සිය කර්මාන්තය පවත්වාගෙන ගිය අතර සිය ව්‍යාපාරයන් ලියාපදිංචි කර ගැනීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීම් කර ඇති බවට සාකච්ඡා විය. | | |
| 08 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව සඳහා ඉදිරිපත් වී ඇති යෝජනා** | | | |
| 8.1 | අනවසර හෝටල් ඉදිකිරීමක් හේතුවෙන් පොදු වෙරළ පරිසරයට හා ප්‍රදේශ වාසීන්ට හානි සිදුවීම | නාකුළුගමුව, මාවැල්ල පන්සල පාර එච්.ටී. සන්ධ්‍යා මහත්මිය විසින් අනවසර හෝටල් ඉදිකිරීමක් හේතුවෙන් වෙරළ සංරක්ෂණ රෙගුලාසි, පොදු ගොඩනැගිලි සීමා නීති උල්ලංඝනය වී ඇති බවත් එමගින් වෙරළ තීරය ආක්‍රමණය කර ඇති බවටත් කරුණු ඉදිරිපත් වූ අතර මෙම ඉදිකිරීම් සඳහා බලපත්‍ර ලබා දී ඇති බවත් තංගල්ල ප්‍රාදේශීය සභාව හා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මෙම ඉදිකිරීම් අනුමත කර තිබෙන බවටත් පසුව ඉදිරියට ඉදිකර තිබෙන තරප්පු පෙළ සවිකිරීම සහ පොල්ගස් හා තහඩු ආවරණ ඉදිකිරීම් අනවසර බැවින් ඒවා ඉවත් කිරීමට අදාළ තහනම් නියෝග මේ වන විටත් සිදුකර තිබෙන බවට කරුණු ඉදිරිපත් කර තිබේ. | මේ සම්බන්ධ ලිපිවල පිටපත් අදාළ ආයතන වෙත යොමු කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව තංගල්ල<br><br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය<br><br>සහකාර අධ්‍යක්ෂ වෙරළ සංරක්ෂණ අධිකාරිය |
| 09 | **දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම** | | | |
| 9.1 | 2027 වර්ෂයේ ප්‍රාථමික පාසල් සංවර්ධන වැඩසටහන සඳහා යෝජිත පාසල් නාම ලේඛනය ඉදිරිපත් කිරීම | තංගල්ල අධ්‍යාපන කලාපයේ නිහිළුව ප්‍රාථමික විද්‍යාලය සහ තේනගම ප්‍රාථමික විද්‍යාලය ද වලස්මුල්ල අධ්‍යාපන කලාපයේ දකුණු කණුමුල්දෙණිය කනිටු විදුහල යන ප්‍රාථමික පාසල් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය යටතේ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී.<br>උඩයාල විද්‍යාලය කඩිනමින් සියු අයිතියට පත් කරන ලෙසත් කටුවන ජාතික පාසල සඳහා තෙමහල් ගොඩනැගිල්ලක අවශ්‍යතාව පවතින බැවින් අනුමත කර යවන ලෙසත් උපදෙස් දෙන ලදී. | ලේකම් අධ්‍යාපන අමාත්‍යාංශය දකුණු පළාත<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂකවරු තංගල්ල, වලස්මුල්ල |
| 9.2 | හ/තෙළුල්ල කනිටු විද්‍යාලය අයත් කොට්ඨාසය වෙනස් කර ගැනීම | මෙම පාසල දැනට අයත් වන්නේ හම්බන්තොට කලාපයේ හම්බන්තොට කොට්ඨාසයට වන නමුත් කි.මී. 53.2 පාසලට සමීපතම කොට්ඨාසය වන්නේ තිස්සමහාරාම කොට්ඨාසය බවත් ඉතා පහසුවෙන් පාසලේ අවශ්‍යතා ඉටු කර | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ හම්බන්තොට |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| | | ගැනීම සඳහා සුදුසු ස්ථානය ලෙස කි.මි.12 ආසන්නයේ පිහිටා ඇති තිස්සමහාරාම කොට්ඨාසය වඩාත් සුදුසු බවය යෝජනා විය. | | |
| 9.3 | ග්‍රාමීය වාරිමාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා සඳහා අනුමැතිය සහ අවශ්‍ය පහසුකම් ලබාදෙන ලෙස ඉල්ලා සිටීම | වාරි මහිම අපේ උරුමය ජාතික වැඩසටහනට අදාලව කෘෂිකර්ම, පශු සම්පත් හා වාරිමාර්ග අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතියට අදාලව දිස්ත්‍රික්කයේ ග්‍රාමීය වාරිමාර්ග ප්‍රතිසංස්කරණ යෝජනා 10ක් සඳහා අනුමැතිය ලබා ගැනීම. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ඉංජිනේරු වාරිමහිම අපේ උරුමය ව්‍යාපෘතිය |
| 10 | සාකච්ඡා කරන ලද වෙනත් කරුණු හා පසුව ලැබුණු ලිපි | | | |
| 10.1 | ජාතික හැඳුනුම්පත් නොමැති වැඩිහිටියන් සඳහා සමාජ ආරක්ෂණ පද්ධතිය හරහා වැඩිහිටි දීමනාව ලබා ගැනීමට කඩිනමින් ජාතික හැඳුනුම්පත් ලබා ගැනීම | අමාත්‍ය මණ්ඩල පත්‍රිකා අංක 25/0436/804/052 හා 2025.03.17 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණයට අනුව, වයස 70ට වැඩි අඩු ආදායම්ලාභී වැඩිහිටි තැනැත්තන් සියලු දෙනා සමාජ දත්ත පද්ධතියේ ලියාපදිංචි කිරීමට අවශ්‍ය කටයුතු කඩිනමින් සිදු කල යුතු බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සාකච්ඡා කර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික්කයේ සියළුම ප්‍රාදේශීය ලේකම්වරු |
| 10.2 | නව ඉන්ධන පිරවුම්හල් ස්ථාපිත කිරීම | දිස්ත්‍රික්කය තුළ ඉන්ධන පිරවුම්හල්වල අවශ්‍යතාව පවතින ස්ථාන හඳුනාගෙන ප්‍රාදේශීය සම්බන්ධීකරණ අනුමැතිය ලද එම ස්ථාන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 10.3 | උද්ධකන්දර ඉහළ ප්‍රදේශයේ පවතින නිවාස ව්‍යාපෘතියට ජලය නොමැති වීම | පානීය ජලය නොමැතිව, පවුල් 750 ඉක්මවා දුෂ්කරතාවයෙන් පසුවන බවත් කඩිනමින් මෙම ගැටළුව විසඳීමට සුදුසු විකල්ප ක්‍රමවේදයන් හඳුනාගනිමින් කටයුතු කළයුතු බවටත් කරුණු ඉදිරිපත් විය. | මේ සම්බන්ධව වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් ඉල්ලීමක් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>අතිරේක දිස්ත්‍රික් ලේකම් (ඉඩම්) |
| 10.4 | සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විදුලි කණු ඉවත් කිරීමේ දී විදුලිබල මණ්ඩලය විසින් ලබාදෙන ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අයකරන මුදල හා ඇස්තමේන්තු ව සම්බන්ධ | වලස්මුල්ල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අදාළව පවත්වනු ලැබූ 2026.07.16 දිනැති ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ දී සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දී විදුලි කණු ඉවත් කිරීමේ දී විදුලිබල මණ්ඩලය විසින් ලබාදෙන ක්ෂේත්‍ර පරීක්ෂණයේ දී අය කරන මුදල හා ඇස්තමේන්තු සම්බන්ධව ගැටළු පවතින බවත්, තංගල්ල පල්ලිකුඩාව පාරේ විදුලිබල මණ්ඩලයට අයත් කණු 03ක් ඉවත් කිරීම සිදුකල යුතු බවටද කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳ අදාළ අමාත්‍යාංශයට යොමු කර උපදෙස් ලබා ගැනීම සුදුසු බවට තීරණය විය.<br><br>කණු ඉවත් කිරීම සම්බන්ධව විදුලිබල මණ්ඩලයේ ඉදිකිරීම් අංශය දැනුවත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට<br><br>ප්‍රාදේශීය ලේකම් වලස්මුල්ල<br><br>ප්‍රධාන විදුලි ඉංජිනේරු තංගල්ල |



බිමල් ඉන්දජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 10.5 | අම්බලන්තොට, මාමඩල, ජංසගම පවත්වාගෙන යනු ලබන පොලිතින් කර්මාන්ත ශාලාව හේතුවෙන් අවට මහජනතාව පීඩාවට පත්වීම සහ පරිසර දූෂණය | අම්බලන්තොට පොලිස් බල ප්‍රදේශයේ මාමඩල හා ජංසගම දැනට පවත්වාගෙන යන පොලිතින් කර්මාන්ත ශාලාව හේතුවෙන් නිකුත් වන අධික දුර්ගන්ධය සහ දුම හේතුවෙන් මෙම ප්‍රදේශය අවට පදිංචි මහජනතාව අධික පීඩාවට පත්ව සිටින බවත් කුඩා ළමුන් සහ වැඩිහිටි ජනතාව ශ්වසන අපහසුතා ආදී ගැටළු වලට මුහුණ පා ඇති අතර පරිසර දූෂණය ද සිදුවන බවට කරුණු ඉදිරිපත් විය. | මේ පිළිබඳව අධ්‍යනය සිදු කර වාර්තාවක් ලබාදෙන ලෙස උපදෙස් දෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 10.6 | ආදර්ශ කෘෂි ගම්මානයක් ගොඩනැගීම සඳහා වන ජල අවශ්‍යතා සපුරාලීම | හුංගම ග්‍රාම නිලධාරී වසමේ තුඩුව ගම තුළ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත උස්සාන ජල ව්‍යාපෘතියට අදාලව ආදර්ශ කෘෂි ගම්මානය සඳහා සකස් කළ සංශෝධිත ඇස්තමේන්තුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කරන ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය ලබාදෙන ලදී. | ප්‍රාදේශීය ලේකම් අම්බලන්තොට |
| 10.7 | ලුනුගම්වෙහෙර නව නගරයේ පිහිටි දැනට භාවිතයට නොගන්නා නව බස් නැවතුම්පළ සම්බන්ධ ගැටළුව | ලුනුගම්වෙහෙර නව නගරයේ පිහිටි දැනට භාවිතයට නොගන්නා නව බස් නැවතුම්පළ, මහජන ප්‍රයෝජනයට ගතහැකි සුදුසු කාර්යක් සඳහා භාවිතයට ගැනීමේ අරමුණින් ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය සභාව වෙත භාරදීම සම්බන්ධයෙන් කරුණු ඉදිරිපත් විය. | නාගරික සංවර්ධන අධිකාරිය සමඟ මේ පිළිබඳ සාකච්ඡාවක් සිදුකර සුදුසු පරිදි තීරණ ගන්නා ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති ප්‍රාදේශීය සභාව ලුනුගම්වෙහෙර<br>ප්‍රාදේශීය ලේකම් ලුණුගම්වෙහෙර<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ නාගරික සංවර්ධන අධිකාරිය |
| 10.8 | බෙලිඅත්ත නගරයේ වාහන රථගාලේ කාණු පද්ධතිය හා භූමි අලංකරණය සඳහා වෙන් කරන ප්‍රතිපාදන ප්‍රමාණවත් නොවීම | බෙලිඅත්ත නගරයේ වාහන රථගාලේ වැසි ජල කාණු පද්ධතිය සකස් කිරීම, ආලෝකකරණය කිරීමට විදුලි පහන් කණු ආදිය සඳහා සහ භූමි අලංකරණය ආදී කටයුතු සඳහා දකුණු පළාත් සංවර්ධන සැළැස්ම - 2026 පළාත් නිශ්චිත ප්‍රධාන යටතේ වෙන් කරන ලද ප්‍රතිපාදන ප්‍රමාණවත් නොමැති බවට කරුණු ඉදිරිපත් විය. | ඇස්තමේන්තු සංශෝධනය කර ඉදිරිපත් කිරීමට අනුමැතිය ලබාදෙන ලදී. | ගරු සභාපති බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව |
| 10.9 | කොටිගොඩැල්ල ක්‍රීඩාංගනයේ වැසිකිළි පද්ධතිය, පැති බැම්බ හා දැල් වැට සකස් කිරීමේ ව්‍යාපෘතිය සඳහා ප්‍රතිපාදන නොමැති වීම | බෙලිඅත්ත ප්‍රාදේශීය සභාවට අයත් කොටිගොඩැල්ල ක්‍රීඩාංගනය විවිධ සංදර්ශන හා උත්සව පැවැත්වීම සඳහා බදු පදනම මත ලබාදීම සිදු කරන බවත් මේ වන විට එහි බැම්ම හා දැල් වැට නිසි ආකාරව සකස් කර නොමැති අතර එහි වැසිකිළි පද්ධතියක් නොමැති බවත් මෙම අවශ්‍යතාවයන් කඩිනමින් ඉදිකර දෙන ලෙසට කරුණු ඉදිරිපත් විය. | ඇස්තමේන්තු සකස් කර ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | ගරු සභාපති බෙලිඅත්ත ප්‍රාදේශීය සභාව |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
| --- | --- | --- | --- | --- |
| 10.10 | හ/සූරියවැව ජාතික පාසලේ ක්‍රීඩාපිටිය පිලිසකර කර දෙන ලෙස ඉල්ලීම | සූරියවැව ජාතික පාසලේ ඔලිම්පික් සහ ජාත්‍යන්තර මට්ටමේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බිහිකිරීමට උරදුන් සුවිශේෂී ක්‍රීඩාපිටියක් පවතින බවත් ක්‍රීඩක ක්‍රීඩිකාවන් දෙසියකට අධික ප්‍රමාණයක් පුහුණුවීම් වල නිරතවන නමුත් මෙහි ජලය බැස නොයාම, වලගොඩැලි ස්වභාවය නඩත්තු කටයුතු සිදුකර ගැනීමේ අපහසුතාව ආදී ගැටළු පවතින බැවින් ක්‍රීඩා පිටිය පිළිසකර කිරීම සිදුකර දෙන මෙන් ඉල්ලා සිටින ලදී. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබාදෙන ලදී. | දිස්ත්‍රික් ලේකම් හම්බන්තොට |
| 10.11 | හ/කටුවන ජාතික පාසල සඳහා 110*25 ප්‍රමාණයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ලක් ඉදිකිරීම. | කටුවන ජාතික පාසල සිසුන් 1750ක් පමණ අධ්‍යාපනය ලබන උසස්පෙළ විද්‍යා, ගණිත, කලා, වාණිජ, ඉංජිනේරු තාක්ෂණවේදය, ජෛව පද්ධති තාක්ෂණවේදය හා 13 වසරක අඛණ්ඩ අධ්‍යාපන ඒකකය යන උසස් පෙළ විෂය ධාරා සියල්ලම ක්‍රියාත්මක වන 6-13 ශ්‍රේණි පරාසය සහිත 1AB වර්ගයේ පාසලක් බවත් වර්තමානය වන විට මෙම පාසල සතුව ඉඩකඩ ප්‍රමාණවත් නොවීමේ ගැටළුවක් පවතින බැවින් 110*25 ප්‍රමාණයේ තෙමහල් පන්ති කාමර ගොඩනැගිල්ලක අවශ්‍යතාවය පිළිබඳ ගරු අධ්‍යාපන අමාත්‍යතුමිය දැනුවත් කළ බවත් මේ වන විට ජාතික පාසල් අධ්‍යාපන අධ්‍යක්ෂ සහ වලස්මුල්ල කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ මඟින් අදාළ නිර්දේශ ලබා ගැනීම සිදුවෙමින් පවතින බවටත් කරුණු ඉදිරිපත් විය. | දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු අනුමැතිය මේ සඳහා ලබාදෙන ලදී. | දකුණු පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ<br><br>කලාප අධ්‍යාප අධ්‍යක්ෂ |
| 10.12 | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය මඟින් පාසල් තුළ අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීමේ වැඩසටහන | ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනය විසින් හම්බන්තොට දිස්ත්‍රික්කයේ පාසල් තුළ අධිවේගී අන්තර්ජාල පහසුකම් ලබාදීමේ වැඩසටහන ක්‍රියාත්මක කරන අතර මේ වන විට ගුරුගොඩැල්ල වීරසිංහ විද්‍යාලයේ පමණක් මේ සඳහා විරෝධතාවයක් මතු වී තාවකාලිකව නවතා තිබෙන බවට කරුණු ඉදිරිපත් විය. | පොලිස් ආරක්ෂාව යටතේ ගුරුගොඩැල්ල වීරසිංහ විද්‍යාලයේ මෙම වැඩසටහනට අදාල කොන්ක්‍රීට් කණු ඉදිකරන ලෙස උපදෙස් දෙන ලදී. | ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තංගල්ල<br><br>කළමනාකරු (මෙහෙයුම්) ශ්‍රී ලංකා ටෙලිකොම්<br><br>කලාප අධ්‍යාපන අධ්‍යක්ෂ තංගල්ල |
| 10.13 | ලුනුගම්වෙහෙර හේන් ගොවීන් සඳහා වල් අවසරය ලබා ගැනීම | කැලෑ ඇතුලත හේන් ගොවිතැන් කටයුතු කිරීම සඳහා වල් අවසරය ලබාදීමට සුදුසු ගොවීන්ගේ නාම ලේඛනයක් ලබා ගැනීම සුදුසු බවට යෝජනා වූ අතර වනජීවී දෙපාර්තමේන්තුව විසින් වල් අවසරය ඊට ලබානොදෙන බවට කරුණු දැක්විය. | හේන් ගොවිතැන් කටයුතු සිදු කරන ගොවීන්ගේ සහ අනවසර ඉවත් කිරීම් සිදුකළ යුතු අයගේ නාම ලේඛනය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස උපදෙස් දෙන ලදී. | සහකාර අධ්‍යක්ෂ වනජීවී (දකුණ) |



බිමල් ඉන්දුජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

| අ.අ | කාරණය | සාකච්ඡා වූ කරුණ | තීරණය | වගකීම |
|---|---|---|---|---|
| 10.14 | නිවස ඉදිරිපස ළිඳක් කපා ගැනීමට ලබාදුන් අවසරය අවභාවිතා කිරීම | තිස්සමහාරාම, දෙබරවැව, ගැමුණුපුර පාර අංක 949 හි පදිංචි සඳුන් රංගන එදිරිසිංහ යන අය ළිඳක් මුවාවෙන් අවිධිමත් අනවසර භූ කැණීම් කටයුතු මාස 10ක් වැනි දීර්ඝ කාලයක් පුරා අඛණ්ඩව සිදුකරගෙන යන බවත් ඒ හේතුවෙන් ජීවිත, දේපළ හා පාරිසරික හානි සිදු වී ඇති බවට කරුණු ඉදිරිපත් විය. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් විසින් මේ සම්බන්ධව පනතේ තිබෙන බලතල අනුව නඩු දැමීම සිදුකරන ලෙසත් පොලීසිය ද මේ සම්බන්ධව නීතිය ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් දෙන ලදී. එමෙන්ම මැණික් හා ස්වර්ණාභරණ අධිකාරිය මගින් මේ පිළිබඳ වාර්තාවක් මීලඟ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙසත් අදාළ සියලු ආයතන සමඟ ක්ෂේත්‍ර පරික්ෂාව කඩිනමින් සිදු කරන ලෙසත් උපදෙස් දෙන ලදී. | ගොවිජන සංවර්ධන සහකාර කොමසාරිස් හම්බන්තොට<br><br>ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි තංගල්ල<br><br>ප්‍රාදේශීය ලේකම් තිස්සමහාරාමය |

අද දින දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු රැස්වීම සාර්ථකව පැවැත්වීම සම්බන්ධයෙන් පැමිණ සිටි සියලු දෙනාටම ස්තුතිය පළ කිරීමෙන් අනතුරුව මෙහි දී ගන්නා තීන්දු තීරණ පිළිබඳව පසු විපරම් කිරීමට බලාපොරොත්තු වන බවත් එය අප සැමගේ වගකීමක් බවටත් වැඩිදුර අවධාරණය කරමින් පස්වරු 3.30 ට පමණ රැස්වීමේ කටයුතු අවසන් කරන ලදී.

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම්/දිසාපති
හම්බන්තොට පරිපාලන දිස්ත්‍රික්කය

බිමල් ඉන්ද්‍රජිත් ද සිල්වා
දිස්ත්‍රික් ලේකම් / දිසාපති
හම්බන්තොට

2026 අගෝස්තු මස ...11...
හම්බන්තොට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී ය.